සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security – Social Security Division

| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/07/SD/15/05 - MEP | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ............ | දිනය<br>திகதி<br>Date | 2020.02.17 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන්

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

සියළුම සමෘද්ධි කළමණාකරුවන්

සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරින්

සියළුම ප්‍රා දේශීය සංවිධානවල සභාපතිවරුන්

සියළුම සමෘද්ධි ප්‍රජාමුල සමිතිවල සභාපතිවරුන්

**<u>"රට හදන සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්තියට අනුව සමෘද්ධි සමාජ සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම.</u>**

රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිරසාර පරිසර ප්‍රතිපත්තියක් යටතේ වැඩ සටහන් කිහිපයක් සමාජ සංවර්ධන හා පරිසර අංශය මඟින් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇති බව කාරුණිකව දන්වමි. අඩු ආදායම්ලාභී ප්‍රජාව රටේ සංවර්ධනයට හා පොදු අභිලාෂයන් ඉටු කර ගැනිම සඳහා නායකත්වය ලබා දෙමින් කටයුතු කිරිමට සැලැස්වීම තුළින් ඔවුන් බල ගැන්වීමද මෙම වැඩ සටහන් වල අපේක්ෂිත අරමුණු වේ.

01. ***"එළිය වැටුණු ගමක්"*** සමෘද්ධි ශ්‍රමදාන වැඩ සටහන - 2020.03.01

- 2013 අංක 1 දරණ සමෘද්ධි පනතේ 5 වන වගන්තියට අනුව පිහිටුවා ඇති ප්‍රජාමුල සංවිධාන බලගැන්වීමින් සමෘද්ධි වැඩසටහන සඳහා ඵලදායී දායකත්වයක් ලබා දීම සඳහා ප්‍රජාමුල සංවිධාන 30,211 මඟින් දිවයිනම ආවරණය වන පරිදි ශ්‍රමදාන 30,211 ක් පැවැත්වීමට කටයුතු සුදානම් කිරිම.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන)<br>பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்)<br>Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

- ඒ සඳහා විවිධ අංශ යටතේ ශ්‍රමදාන වැඩ සටහන් සූදානම් කිරීම.

  ප්‍රජාමූල සංවිධාන බල ප්‍රදේශයකට වෙරළ මායිම් වන අවස්ථාවල දී මෙම ශ්‍රමදානය වෙරළ පිරිසිදු කිරීමේ ශ්‍රමදානයක් ලෙස සංවිධානය කිරීම.

  ප්‍රජාමූල සංවිධාන බල ප්‍රදේශයකට ගංඟාවන්, ඇළ දොළ හෝ වැවක් මායිම් වන අවස්ථාවක දී ගංඟා, ඇළ දොළ පිරිසිදු කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රමදානය සංවිධානය කිරීම ආදී පෙන්වා දිය හැක.

- ප්‍රජාමූල සංවිධාන බල ප්‍රදේශයේ වඩාත් උචිතම ඵලදායී ස්ථානයක ශ්‍රමදානය සංවිධානය කිරීම යෝග්‍ය වන අතර මෙහි දී පිරිසිදු කරන ස්ථානයේ පවිත්‍රතාවය තිරසාරව පවත්වා ගෙන යාම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සැකසීම.

- ශ්‍රමදාන වැඩ සටහන තුළ දී ඒකරාශී වන අපද්‍රව්‍ය වර්ග කරමින්, පුළුස්සා දැමිය හැකි අපද්‍රව්‍ය පුළුස්සා දැමීමටත්, ප්ලාස්ටික්, පොලිතින් ආදී වශයෙන් වෙන් වෙන් වර්ග කර ඉවත් කිරීමේ කටයුතු සඳහා ප්‍රදේශයේ පලාත් පාලන ආයතනය සමඟ විධිමත්ව සම්බන්ධීකරණයක් සිදු කිරීම.

02. ***"යුතුකම වෙනුවෙන් පැලයක් සිටුවමු"*** රුක්රෝපණ වැඩ සටහන

- ප්‍රදේශයේ පවතින කාලගුණික තත්වය හා තිරසාර භාවය පිළිබඳ අවධානය යොමු කරමින් රුක්රෝපණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.

03. පොදු උපදෙස් -

- මෙම වැඩ සටහන සඳහා සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන මහා සභා අනුමැතිය මත හෝ ආවරණ අනුමැතියට යටත්ව විධායක සභාවේ අනුමැතිය මත සිදු කළ යුතු අතර මහ සභාව හෝ විධායක සභාව තීරණය කරනු ලබන අවම වියදමක් එම සංවිධාන අරමුදලින් වියදම් දැරීමට මෙමඟින් අවසරය ලබා දෙනු ඇත.

- මේ සමඟ එවා ඇති ආකෘති පත්‍රයට අනුව ඔබ දිස්ත්‍රික්කයේ පවත්වන ලද ප්‍රධාන වැඩ සටහන්වල විස්තර 2020.04.10 දිනට පෙර සමාජ සංවර්ධන හා පරිසර අංශය වෙත එවිය යුතුය. ඒ සඳහා socialdev@samurdhi.gov.lk යන විද්‍යුත් ලිපිනය භාවිතා කළ හැක.

මෙම කාර්යයන් සාර්ථක කර ගැනිම සඳහා ඔබෙන් ලැබෙන සහයෝගය කෘතවේදීව අගය කරමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත -

| | |
|---|---|
| 01. කාන්තා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ ගරු අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය | - කරු. දැ.ගැ.ස. |
| 02. සමාජ ආරක්ෂණ ගරු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මැතිතුමා | - කරු. දැ.ගැ.ස. |
| 03. ලේකම්, කාන්තා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස. |
| 04. ලේකම්, සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස. |
| 05. සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 06. අධ්‍යක්ෂ ජනරාල්, වාරි මාර්ග දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 07. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - වැඩ සටහන පරීක්ෂා කර වාර්තාවක් ලබාදීම |
| 08. සියළුම අධ්‍යක්ෂවරුන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.ස. |